# විශ්‍රාන්තයේ හැරවුම් ලක්ෂ

ආර්.ජේ.වාසනා ජයසේන

තාක්ෂණික දියුණුවේ නව මංපෙත් විවර වීමත් සමඟින් නූතන සමාජ රටාව විද්‍යුත් තාක්ෂණය හා වෙලී පැවතීම හේතු කොටගෙන මිනිස් ජීවිත තුලින් විශ්‍රාන්තිය වියපත් වී පොළෝ කුහරයේ සැඟවී ඇත.තාක්ෂණික ලෝකයෙන් මදකට නතරවී සෙව්වා වූ විශ්‍රාන්තියේ ප්‍රතිඵලයකි,"සැඟවුණු ලෝකය".

සුළඟ හමන අතට පාවෙන එම යෝධ සරුංගල්වල සිව්කොන් ගැටගසා ඉන් පහතට එල්ලෙන ලනු පොටවල් හතර,සුක්කානමක් වැනි කොටසකට සම්බන්ධ වේ.එය අතින් අල්ලා ගත් සුදු ජාතිකයෝ පිරිසක් සුළඟේ පාවෙන යානාව තම දෑත්වලින් පාලනය කර ගනිමින් නිල්වන් ජල තලය මත රළ පදිමින් සීරුවට ඇදීයති...තම සඟයන් මහා සරුංගල් අහසට යවා ඉතා පළපුරුදු රියදුරන් තම මෝටර් රථය හරව හරවා සීරුවෙන් පදවන්නා සේ දෑතින් අල්ලා ගත් හැඬලයකින් ගමන් මාර්ගය වෙනස් කරමින් අනෙකක හැපීමට ඉඩ නොදෙමින් දිය මත ලිස්සා යන සැටි ඔවුහු බලා සිටිති...තැනින් තැන කූඩාරම් අටවාගෙන නොයෙකුත් කෑම බීම වර්ග කමින් බොමින් විවෙකය සඳහා තාවකාලිකව තනාගත් සයන වල බෑවී සිටින සුදු ජාතිකයන් හැම තැනම දකිය හැකිය...තම පැමිණි මෝටර් රථය ඈතින් නවතා,රථයේ දමාගෙන ආ පැදුරක් එළාගෙන මෙම විවේකී පරිසරයේ සිට භුක්ති විඳීම සඳහා ගෙන ආ කෙටි ආහාර හා බීම වර්ග පැදුරේ පසක තබාගෙන අමල්,ඔහුගේ බිරිඳ හා තම මැණියෝ මෙසේ පැදුරේ වාඩි වී අහස දෙස හිස් දිගුකරගෙන"වින්ඩ් සර්ෆින්"ක්‍රීඩාව නරඹති...

දොළොස් වෙනි උපන්දිනය දවසේ අපි උදේ ළමා නිවාසයේ ළමයින්ට කෑම බීම දීලා තෑගි බෝග දුන්න වෙලවේ නම් අත්තම්මා සන්තෝසෙන් සිටියා...සවස එයාගේ පන්තියේ යාළුවොයි මගේ යාළුවොයි ගෙනල්ලා බර්ත්ඩේ පාටිය දාපු වෙලාවේ...පුතා හොඳ බංගලාවක් බුක් කරගෙන මේ සරුංගල් සෙල්ලම් බලන්න ආවේ...අර ලස්සන මුහුද දිහා බලන්න.සරුංගල් දිහා බලන්න.වැලි තලාව දිහා බලන්න.ටිකක් දිව්වට පැන්නට  කමක් නෑ....අමල් තම රබර් සෙරෙප්පු දෙක ද ගලවා දමා,සනීපෙට පෑගෙන වැල්ල මතින් ළමුන් තිදෙනා සිටින දෙසට ගමන් කළේය.සිහින් සුළං රැල්ලක් හමා යයි.ඉන් ගතට දැනෙන්නේ ඉමහත් සුවයකි.ඇසට පෙනෙන නිල් අහසත් ළා නිල් මුහුදු ජලයත් අමල්ගේ සිත තුළට සොඳුරු සිතුවිලි කැන්දාගෙන එයි...ඉතා විවේකයෙන් වැල්ලේ වැතිර විනෝද වන සුදු ජාතිකයන් මෙන්ම රළ පදින සුදු ජාතිකයන්ගේ වික්‍රම නරඹමින් අමල් එහා මෙහා ඇවිද්දේ පොඩි ළමයෙකු මෙන් අපමණ සතුටක් විඳිමිනි...ඔවුන්ට යම් යම් දේ කියා දෙමින් ඔහුගේ කැමරාව ක්‍රියා කරවමින් බෝට්ටුවත් අවට පරිසරයත් රූගත කරයි...පෙරදා සවස කූඩාව සංචාරක කලාපයේදී තමන් දුටු විදේශීය රළ පදින්නන්ගේ විසිතුරු ජවනිකා ඔහුගේ සිතේ මැවෙන්නට විය...ලෝකයේ දස දෙසින් පැමිණෙන සංචාරකයන් මුළු ප්‍රදේශයේම අහසත් ගොඩබිමත් වර්ණ කලාපයන් බවට පත් කරමින් නිදහසේ විනෝද වන සැටි ඔහුට සිහි විය...මාත් ආසයි සත්තු බලන්න.ඉබ්බෝ,කක්කුට්ටෝ,කක්කුටු බෙන බලන්න මාත් හරි ආසයි...

දූපතට ඈතින් බෝට්ටුව පදවාගෙන ගිය ඈන්ටන් පළමුව දූපත නැරඹීමට ඉඩ දී සම්පූර්ණ වටයක්ම ගියේ ගොඩ බැසීමට සුදුසුම තැන සොයමිනි...එම ඉටි රෙද්ද බිම එළා එහි වාඩිවීමට සැලැස්වූ ඈන්ටන් ඔවුන්ට කෑම  බීම ගැනීමට ඉඩ දී පඳුරු අතරින් නොපෙනී ගියේ විවේකයෙන් ගත කිරීමේ අවස්ථාව ආගන්තුකයන්ට ලබා දෙමිනි..."ජල්ලි පිල්ලි පිල්ලි ජල්ලි"යි කියමින් නර්තනය පාමින්ම ඔහු රන්සිත් සමඟ පඳුරු අතරින් නොපෙනී ගියේය...තාත්තා අපි කන්ද උඩට නැග ගත්තා විතරයි, මෙතන ඉඳලා බලන කොට වටේටම නිල් පාටට ලස්සනට පේනවා.අපි දැන් පින්තූර ගන්නවා...කඳු මුදුනට වී අවට දර්ශන රූගත කරමින් සිටි අවස්ථාවේ දී අමල් ඉදිරි කොටස මීටර දෙකක් පමණ එසවුණු මනා පෙණ රැල්ලක් අහසට විහිදුවමින් දියපාර කපාගෙන ඉදිරියට යන අධිවේගී බෝට්ටුවක් දුටුවේය.එම අසිරිමත් දර්ශනය කෙරෙහි අමල්ගේ සිත ඇදී ගියේය...ඔහු තම අතවූ වීඩියෝ කැමරාව සූම් කොට බෝට්ටුවේ ගමන රූගත කරමින් සිටින විට විනාඩි දෙක තුනක් ඇතුළත බෝට්ටුව  එකවරම දූපත පැත්තට හරවා...

නූතන විද්‍යුත් ලෝකය තුළ කාර්යබහුල වූ ජීවිත ගත කිරීමත් සමඟ දුරස් වූ විශ්‍රාන්තියේ නවතම පිබිදීමේ මංපෙත "සැඟවුණු ලෝකය" නම් කෘතිය වේ.

රන්ජිත් ධර්මකීර්ති (2014) සැඟවුණු ලෝකය, (ප්‍රථම මුද්‍රණය)සබිල ප්‍රකාශන, 8,සිරිගල් මාවත, කොහුවල, නුගේගොඩ.